## ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව - 2018

-----------------------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කෘෂි පර්යේෂණ පශ්චාත් උපාධි හා කෙටිකාලීන වැඩමුළු සඳහා විදේශගත වන නිලධාරීන් සහභාගි කරවීම වෙනුවෙන් දරන ලද රු.49,213,526 ක මුදල මෙහෙයුම් වියදම් ලෙස දක්වනු වෙනුවට පරිපාලන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම වියදම් මෙහෙයුම් වියදම් යටතේ ආදායම් ප්‍රකාශනයේ දැක්වීමට එකඟ වෙමි. | වියදම් වල ස්වභාවය සලකා නිවැරිදි ලෙස වර්ගීකරණය කර ගිණුම් තැබීමට කටයුතු කලයුතුය. |
| (ආ) | දේශීය කෘෂි පර්යේෂණ කටයුතු සඳහා මුදල් නිදහස් කිරීම හා අධීක්ෂණය ආයතනයේ සාමාන්‍ය කටයුත්තක් වුවද ඒ සඳහා දරන ලද රු.12,135,933 ක වියදම මෙහෙයුම් වියදම් වෙනුවට ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2019 වසරේ දී පෙර වසරට අදාළ ගැලපීමක් ලෙස කෘෂි පර්යේෂණ පශ්චාත් උපාධි හා කෙටිකාලීන වැඩමුළු සඳහා විදේශගත වන නිලධාරීන් වෙනුවෙන් දැරූ වියදම් මෙහෙයුම් වියදම් ලෙස ආදායම් වියදම් දැක්වීමට භාණ්ඩාගාරයෙන් කෘෂි පර්යේෂණ සඳහා ලද අරමුදල් නිදහස් කරනු ලබන්නේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙසය. එබැවින් එය පර්යේෂණ සඳහා ලද අරමුදල් ලෙස ප්‍රාග්ධන සටහන් වල ඉදිරිපත් කර ඇත. නමුත් මෙහි වියදම්හි පුනරාවර්තන 2019 වසරේ සිට මෙහි බලපෑම ආදායම් වියදම් ප්‍රකාශනයට නාමික ගිණුම් සටහන් ලෙස ඉදිරිපත් කිරීමට එකඟ වෙමි. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කාර්යාල ගොඩනැගිල්ලට තිරරෙදි සවිකිරීම වෙනුවෙන් දරන ලද රු.438,258 ක වියදම ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වසරේදී මෙම වරද නිවැරදි කිරීමට අදාල ද්විත්ව සටහන් ගිණුම්ගත කිරීමට එකඟ වෙමි. | - එම - |
| (ඈ) | භාන්ඩාගාර ප්‍රදාන මගින් හා පැවරීමෙන් ලද රු. 76,990,978 ක වටිනාකමැති ස්ථාවර වත්කම් සඳහා 2016 හා 2017 වර්ෂ වලදී එකතුව රු.12,214,980 ක් ක්‍රමක්ෂය කර තිබුණද 2018 වර්ෂයට අදාලව ක්‍රමක්ෂය කර නොතිබුණි. | 2018 වර්ෂයේ මිලදී ගැනීම් අගයට අදාලව හඳුනාගත් විලම්භිත (Deferred) අරමුදලෙන් 2018 වර්ෂයට අදාල ක්‍රමක්ෂය ප්‍රමාණය පමණක් විලම්භිත ආදායමක් ලෙස ලාභයට ගලපා ඇත.<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20, රාජ්‍ය ප්‍රදාන ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් යටතේ අනාවරණයට අනුව ස්ථාවර වත්කම් වලට අදාළව ක්‍රමක්ෂය හඳුනා ගැනීමට නම් අදාල ස්ථාවර වත්කම් වටිනාකමට සමාන ප්‍රමාණයකින් විලම්භිත අරමුදලක් ඇති කර ගත යුතු වුවද 2011 සිටම එවැනි අරමුදලක් ඇති කර නොගෙන ස්ථාවර වත්කම් වලට අදාළ විලම්භිත ආදායමක්, ආදායම් වියදම් ප්‍රකාශනයට ගළපා ගිණුම්ගත කර තිබීමයි. නමුත් පෙර වසර වල ඇති කර නොගත් විලම්භිත අරමුදල ඇති කර ගැනීමට තරම් ප්‍රමාණවත් තොරතුරු හා දත්ත සොයා ගැනීමේ අපහසුතාවක් පැන නැගුණ බැවින් අදාල ගිණුම් ප්‍රමිතියට අනුව 2018 වසරේ සම්පූර්ණ මිල දී ගැනීම් අගය වන රු.2,319,375 අගය සඳහා පමණක් විලම්භිත අරමුදලක් ඇති කර 2018 වසරේ මිලදී ගැනීම් වලට අදාල ක්ෂය වටිනාකම වන රු. 110,685 ක වටිනාකමකින් ක්‍රමක්ෂය ගලපා එය විලම්භිත ආදායමක් ලෙස 2018 වසරේ ලාභයට ගළපා ඇත | ස්ථාවර වත්කම් වටිනාකම නිවැරදිව හඳුනාගෙන නිවැරදිව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කලයුතුය. |
| (ඉ) | 2010 හා 2011 වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලද පරිගණක, කාර්යාල උපකරණ හා පොත් වල ශුද්ධ වටිනාකම වූ රු. 116,892 ක ශේෂය 2015 වර්ෂයෙන් පසුව ක්‍රමක්ෂය කර නොතිබුණි. | හිටපු ගණකාධිකාරවරයාගේ වැඩතහනම් කිරීම සිදු කළ වසරේ සිට මෙම පරිත්‍යාග ක්‍රමක්ෂය කර නොමැති බව පසුගිය මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය කර ගත හැකි වුව ද ඔහු ඉවත් වීමෙන් අනතුරුව, අදාළ ක්‍රමක්ෂය සඳහා පදනමක් අනාවරණය කර ගැනීමට නොහැකි වී ඇත. එබැවින් ඒ සඳහා ක්‍රමක්ෂය කිරීම සිදු කර නොමැත. | පදනමක් අනාවරණය කර ගැනීමෙන් පසු ක්‍රමක්ෂය කිරීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | භාන්ඩාගාරයෙන් ලද ප්‍රදාන වලට වඩා වැඩි මුදලක් වියදම් ලෙස ගැලපීම් සහ එම ප්‍රදාන වලට අදාල ක්‍රමක්ෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු නොකිරීම නිසා භාන්ඩාගාර ප්‍රදාන අරමුදල් ගිණුම සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 6,468,925 ක හර ශේෂයක් වී තිබුණි. එම වැරදි හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 මූල්‍ය වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලද මුදලට වඩා රු.612,336.53 ක මුදලක් වියදම් කර ඇති අතර එය පුනරාවර්තන වියදම් සඳහා ලද ප්‍රදාන වලින් ආවරණය කර ගෙන ඇත.<br>භාණ්ඩාගාර ප්‍රදාන ඍණ ශේෂයට හේතු වී ඇත්තේ විලම්භිත අරමුදලක් ඇති කර නොගෙන ක්‍රමක්ෂය ගැලපීම් කිරීම බව හඳුනාගත්ත ද එය තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි සොයා ගත නොහැකි විය.<br>මේ පිළිබඳව නොකඩවා සොයා බැලීම් කරමින් පවතින බව ද දැනුම් දීමට කැමැත්තෙමි. | භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන වලට අදාල ක්‍රමක්ෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කලයුතුය. |

**1.5.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සභාපතිගේ ධුර කාලය 2018 නොවැම්බර් 07 දින අවසන් වී ඇති නමුත් 2018 නොවැම්බර් හා දෙසැම්බර් යන මාසයන් සඳහා රු.197,600 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | 2019.05.06 දින අමාත්‍යාංශයේ පැවැති විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා වූ පරිදි මේ සම්බන්ධයෙන් අතිරේක ලේකම්තුමිය විසින් ලබා දෙන වාර්තාව පදනම් කරගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | වැරදි ලෙස අනුමත කල නිලධාරීන්ට එරෙහිව කටයුතු කලයුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පනත 16 වගන්තිය | අරමුදලක් පිහිටුවා ගත යුතු බවත් එම අරමුදල සභාවට ලැබෙන සියලු මුදල් ණය පරිත්‍යාග හා ප්‍රදාන බැර කල යුතු බවත් , එම අරමුදලින් සභාවේ කාර්යයන් සඳහා කරනු ලබන සියලු වියදම් දැරිය යුතු බව සඳහන් වේ. නමුත් 2015 වර්ෂයෙන් පසුව මෙම අරමුදල ඉහත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | හිටපු ගණකාධිකාරීවරයාගේ වැඩ තහනම් කිරීමෙන් අනතුරුව අදාල අරමුදලට ගිණුම් සටහන් දමා නොමැති අතර ඒ සඳහා ගිණුම් සටහන් දැමීමට අදාළ පදනම අනාවරණය කර ගැනීමට නොහැකි විය. ඉදිරියේදී අදාල අරමුදල පිළිබඳව සොයා බැලීමට එකඟ වෙමි. | පනතට අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 26,420,267 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,432,733 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 20,987,534 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන වැඩියෙන් ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව රු. 116,000 ක් වැයකර 2016 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබූ ටයර් 04 ක් විගණිත දිනය වූ 2019 මැයි 15 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | මෙම උපයෝජනයට නොගත් ටයර් 04 සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිපත්ති සභාවේ අනුමැතිය අනුව එම ටයර් මිලදී ගන්නා ලද WPPC 3499 දරණ කැබ් රථයේ දැනට යොදා ඇති ටයර් භාවිතය සළකා බලා එම ටයර් වෙනුවට මෙම විගණනයට භාජනය වූ ටයර් 4 ප්‍රතිස්ථාපනය කිරීමට උපදෙස් ලැබුණි.<br>ඒ අනුව දැනට දුර 38,726 KM ධාවනය කර ඇති බැවින් නුදුරු දිනකදී එම ටයර් ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පසු මිලදී ගැනීම් සිදුකල යුතුය. |

## 3.2 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව රු.22,477,890 ක් වැයකර 2012 වසරේ ඉදිකරන ලද ගොඩනැගිල්ල පවතින ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ (වර්තමාන HARTI) ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙකු වන ඩී සී පී සෙනෙවිරත්න මහතාගේ 10/1/5/ දරන හා 1990.08.01 දිනැති ලිපිය මඟින් 1989 අංක 54 දරන ඉඩම් සැලැස්මේ කැබලි අංක 1 හා 2 කොටස් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීම සඳහා පැවරීමට අනුමැතිය ලබා දී ඇත.<br>අපගේ වාර්තා අනුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු හා පර්යේෂණ ආයතනය සතු ඉඩම ඉඩම් ආඥා පනත යටතේ ප්‍රදානය කරන ලද ඉඩමක් වේ. | ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීමට කටයුතු කලයුතුය.<br>. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, පර්යේෂණ නිලධාරී, පුස්තකාලාධිපති, පරිපාලන නිලධාරී, කළමණාකරන සහකාර ආදී තනතුරු සඳහා පුරප්පාඩු 07ක් මාස හයේ සිට වසර දෙකක කාලයක සිට පැවතියද ඒවා සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම සභාවේ ප්‍රධාන කටයුතු ඉටුකිරීමට බාධාවක්ව පැවතුණි. | පුරප්පාඩුව පවතින පර්යේෂණ නිලධාරී, පුස්තකාලයාධිපති, කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) රියදුරු තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාළව මූලික කටයුතු ආරම්භ කර ඇති අතර ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, පරිපාලන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කලයුතුය. |
| බඳවා ගැනීමේ පටිපාටිය අනුව සභාවේ ලේකම් අවුරුදු 35 ට වැඩි හා අවුරුදු 55 ට අඩුවිය යුතු බව දක්වා තිබුනද ඊට පටහැනිව අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම ගිය නිලධාරියකු පත්කර තිබුණි. | 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා පනතේ 4.1 වගන්තිය ප්‍රකාරව සහ එහි II කොටසේ 12(I) වගන්තිය ප්‍රකාරව සභාවේ ලේකම්වරයා පත් කිරීමේ බලය විෂයභාර අමාත්‍යවරයා සතුවේ.<br>අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව අධ්‍යක්ෂ/ ලේකම් තනතුර සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරකි.<br>මෙම විගණනයට භාජනය වී ඇති ආචාර්ය ජේ ඩී එච් විජේවර්ධන මහතා කෘෂිකර්ම අමාත්‍යංශයේ හිටපු අධ්‍යක්ෂවරයකු/අතිරේක ලේකම්වරයකු ලෙස සේවය කර විශ්‍රාම ගිය කීර්තිමත් රජයේ නිලධාරියෙකි.<br>ඒ අනුව, විෂයභාර අමාත්‍යවරයාට පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව සහ බඳවා ගැනීමේ පටිපාටියේ 4.1 වගන්තියේ සඳහන් සුසුදුකම් සපුරා ඇති බැවින් ජේ ඩී එච් විජේවර්ධන මහතාව සභාවේ ලේකම් ලෙස හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් පත්කර ඇත. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව කටයුතු කල යුතුය. |